
10

# මාධ්‍ය සංස්කෘතිය



ආචාර්ය ටියුඩර් වීරසිංහ

සංස්කෘතිය මානව ජීවිතයේ වඩාත්ම පැරණිම ප්‍රපංචයක් වන අතර, එය මිනිසා සමගම බිහි වුවද මානව සංස්කෘතියේ ප්‍රාථමික ස්වරූපය පූර්ව මානව පරිණාමය අවධියේ ද නිරීක්ෂණය කළ හැකි වන්නේය. තොරතුරු ප්‍රගමනයේ ජානමය ස්වරූපය අභිබවා තොරතුරු ප්‍රගමනයේ සමාජීය ස්වරූපය සමග ම මානව සංස්කෘතිය බිහි වීම, වර්ධනය වීම, වෙන් කළ නොහැකි ලෙස සහසම්බන්ධය. එසේම සංස්කෘතිය මානව සත්තාවේ සංකීර්ණතම ප්‍රපංච අතර එක් ප්‍රපංචයක් වන අතර එය සෙසු විෂය, ක්‍රියාකාරී ක්ෂේත්‍රය සමඟ ඇති සම්බන්ධය පරිකල්පනිකව පවා වෙන් කර හඳුනා ගැනීමට නොහැකි තරමට ම දුෂ්කර ය. සංස්කෘතිය යනු සංකීර්ණ සහ බහුරූපික ප්‍රපංචයකි (Zenoview, 1995).

සංස්කෘතිය සෙසු සියලුම සත්ත්වයන්ගෙන් සහ ස්වභාවධර්මයෙන් ගුණාත්මකව වෙනස් වන්නේය. සංස්කෘතිය අධ්‍යයනය කිරීම කෙරෙහි අවධානය යොමු වූයේ එය බිහි වී, වර්ධනය වී බොහෝ කලකට පසුවය. වසර දහස් ගණනක් සංස්කෘතිය නම් ප්‍රපංචය මිනිසා සහ සමාජය සමග එකට පැවති අතර ඒ කෙරෙහි කිසිම විශේෂ වූ අවධානයක් හා හැඟීමක් ද නොවීය. 'සංස්කෘතිය' පිළිබඳ වචනය සමාජය තුළ තිරසාර භාවිතයට පැමිණියේ දහඅටවන සියවසේ දීය. සංස්කෘතිය යන වචනය පුරාතන රෝම යුගයේ දී බිහි වූ අතර, එය ලතින් භාෂාවෙන් අදහස් වූයේ කෘෂිකර්මය (Agriculture) යන්න වන අතර, එහි අර්ථය වූයේ වගා කිරීමයි, රෝපණය කිරීමයි, පිළිසකර කිරීමයි.

එනම් භූමිය පිළිසකර කිරීම හෝ භූමිය රෝපණය කිරීමයි. මෙම පදයේ ප්‍රාරම්භක අර්ථය පසුකාලීනව මානව සමාජ ක්ෂේත්‍රයෙහි පෞරුෂය සම්බන්ධව භාවිතයට පැමිණි අතර එහිදී එය උදාරත්වය, සම්පූර්ණත්වය යන අර්ථ අදහස් වූ අතර, දහඅට වන සියවසේ අධ්‍යාපන යුගයේ දී, එය ආධ්‍යාත්මික සංස්කෘතියට පමණක් සීමා විය. එහිදී මූලික වශයෙන් වැදගත් වූයේ අධ්‍යාපනය ලද බව, උගත් බව, ශික්ෂිත බව, වියත් බවයි. සංස්කෘතික අධ්‍යයනය කිරීම දහනව වන සියවස මැද භාගයේ දී ආරම්භ වූ අතර එහිදී සංස්කෘතිය විවිධ විද්‍යාත්මක ප්‍රවේශ ඔස්සේ අධ්‍යයනය කළ බව සඳහන් කළ යුතුය. දාර්ශනික, ඓතිහාසික, භාෂාවේදාත්මක, මානව විද්‍යාත්මක හා මානව වංශවේදාත්මක ආදී ප්‍රවේශ ඔස්සේ සංස්කෘතිය අධ්‍යයනය කරන ලදී. විසිවන සියවසේ දී සංස්කෘතික අධ්‍යයනයේ නව ප්‍රවණතාවක් ලෙස හැඳින්විය

හැකි සංස්කෘතිකවේදය (Culturology) විෂය බිහිවූ අතර අප දැන් කතා කිරීමට සූදානම් වන මාධ්‍ය සංස්කෘතිය යනු සංස්කෘතිකවේදයේ දරුවාය. එනම් මාධ්‍ය සංස්කෘතිය ඓතිහාසිකව බිහිවී වර්ධනය වන්නට වූයේ සංස්කෘතිකවේදය තුළය. 19 වැනි සියවස ආරම්භයේ සිට ම සංස්කෘතිකවේදය යන පාරිභාෂිකය භාවිතයට ගත් අතර, 20 වැනි සියවස ආරම්භයේ දී සංස්කෘතිය පිළිබඳ පොදු න්‍යායක් ගොඩනැගීමට ප්‍රයත්න දැරූ ලෙස්ලි වයිට් සංස්කෘතවේදය සංකල්පයක් ලෙස පුළුල් භාවිතයට යොමු කළේය (white, 1959). නමුත් සංස්කෘතිකවේදයේ පියා ලෙස සලකනු ලබන්නේ එඩ්වර්ඩ් ටයිලර්ය. සංස්කෘතිකවේදය යනු සංස්කෘතික වටිනාකම් සහ හර ව්‍යූහයක් ලෙස සලකා සිදුකරනු ලබන අධ්‍යයන සමස්තය සහ සංස්කෘතියේ පැවැත්මේ ක්‍රියාකාරීත්වයේ සහ පරිණාමයේ නියම අධ්‍යයනය කරමින් එහි නියමානුකූලතා අනාවරණය කිරීමයි (silicrev, 2000). සංස්කෘතිකවේදය තුළින් මාධ්‍ය සංස්කෘතිය යන ප්‍රපංචය බිහිව වර්ධනය වන්නට වූයේ විසිවන සියවසේ තුන්වන කාර්තුවේදීය.

වචනයේ පුළුල් අර්ථයෙන් සලකා බලන විට සංස්කෘතිය යනු ස්වභාවධර්මයේ විකරණයක් වන අතර, ස්වභාවික ලෝකයෙහි නියමවල ක්‍රියාකාරීත්වයේ සීමා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සංස්කෘතිය බිහිවන බව ප්‍රකාශ කළ හැකිය. එනම් කැලෑ නීතියෙන් ඉවත් වීමයි. මානව සමාජයේ වර්ධනයේ ඕනෑම මට්ටමක දී භාෂාව මෙන් ම සංස්කෘතිය ද සාමූහික ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයකි. සංස්කෘතිය පොදු වුව ද, සමාජීය වුව ද, ප්‍රපංචයකි. සංස්කෘතිය මානවයාගේ දෙවන ස්වභාවය වන අතර අන්‍යෝන්‍ය සමාජ ක්‍රියාකාරීත්වය සහ හැසිරීම නියාමනය කරන්නා වූ ප්‍රභවයක් වන සංස්කෘතිය මිනිසුන් විසින්ම නිර්මාණය කරන ලද ස්වයංසාක්ෂාත්කරණයේ සහ පැවැත්මේ ක්ෂේත්‍රයක් වශයෙන් සංස්කෘතිය නිර්වචනය කළ හැකිය.

මේ අර්ථකථනයට අනුව සංස්කෘතිය යන්න අප අතර සිදුවන සියලු අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය අදහස් වන අතර ඕනෑම සංස්කෘතික අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වයක් සන්නිවේදන සම්බන්ධතාවක් ලෙස ගෙනහැර දැක්විය හැකිය. සංස්කෘතියක අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය යනු සන්නිවේදනයයි. මෙහි මූලික යන්ත්‍රණයේ මූලිකාංග වන්නේ පණිවිඩය යවන්නා (සන්නිවේදකයා) සම්ප්‍රේෂණ මාධ්‍ය (නාලිකාව) සහ පණිවිඩය සංජානක (ග්‍රාහකයා) මෙම ත්‍රිත්වය සංස්කෘතියේත්, සන්නිවේදනයේත් මූලික පදනම වේ.

සංස්කෘතිය තුළ සංහතික මාධ්‍ය සන්නිවේදනය ඓතිහාසික ක්‍රියාවලියක ස්වභාවයක් ගන්නා අතර, එය සමාජ අවශ්‍යතා මත තත්ත්වාරෝපණය වෙමින් පුද්ගල සමාජානුයෝජනය සහ සංස්කෘතියේ ක්‍රියාකාරීත්වයට උපස්ථම්භක වන්නේය. සංස්කෘතියේ ඉතිහාසය දෙස බලන විට සන්නිවේදන ස්වරූප රාශියක් හඳුනාගත හැකිය. ස්පර්ශක සන්නිවේදනය, ආඝ්‍රාහක සන්නිවේදනය, අවාචික සන්නිවේදනය, දෘශ්‍ය සන්නිවේදනය, ශ්‍රව්‍ය සන්නිවේදනය, දේහාත්මක සන්නිවේදනය, වාචික සන්නිවේදනය, ලේඛන සන්නිවේදනය, මුද්‍රිත සන්නිවේදනය, ශ්‍රව්‍ය - දෘශ්‍ය සන්නිවේදනය, විධිමත් සන්නිවේදනය, අවිධිමත් සන්නිවේදනය, බහුමාධ්‍ය සන්නිවේදනය, අභිසාරී සන්නිවේදනය ආදී ස්වරූප මානව වර්ගයාගේ සමාජ පරිණාමයේ අන්‍යෝන්‍යව ක්‍රියාත්මක වෙමින් මිනිසාගේ ශක්‍යතාව සහ අවශ්‍යතා සාක්ෂාත්කරණයෙහිලා ආධාරක වූ බව සඳහන් කළ යුතු ය.

මිනිසා සිය මානසික සහ සමාජීය නිර්මාණාත්මක ක්‍රියාවලිය තුළ තම හැඟීම්, සංවේදීතා, භාව සහ බුද්ධිමය ශක්‍යතා ප්‍රකාශයට පත් කිරීම සඳහා විවිධ සන්නිවේදන ස්වරූප ප්‍රයෝජනයට ගෙන ඇති බවට මාධ්‍ය සංස්කෘතික ඉතිහාසය සාක්ෂි දරන්නේය. මානව සමාජ පරිණාමයේ සෑම යුගයකදීම ඊට සරිලන අලුත් ප්‍රමුඛ සංස්කෘතික ස්වරූප බිහිවන අතර ඒවා වඩාත් කාර්යක්ෂම ලෙස මිනිස් අවශ්‍යතා හා ළැදියා සංතෘප්තිමත් කරලීම සඳහා යොමුව පවතී. එම ස්වරූප මානව ප්‍රයෝජනයට ගැනීම සමාජවල සමාජිකයින් අතර සහජීවනය, සහයෝගීතාව, අන්‍යෝන්‍ය අවබෝධය, සමාග්‍රය, සන්නිවේදන මට්ටම සමඟ සමපාත වන්නේය. අප මීට පෙරද සාකච්ඡා කර ඇති පරිදි මාධ්‍ය සංස්කෘතිය යන පාරිභාෂිකය සංස්කෘතිකවේදී (Curturologist) න්‍යායේ ළදරුවෙකු වන අතර, එය විසි වැනි සියවසේ තෙවැනි කාර්තුවේදී පමණ බිහි වී අද්‍යතනය වන විට සංස්කෘතික අධ්‍යයනය, මාධ්‍ය අධ්‍යයනය ආදී විෂය ක්ෂේත්‍රවල මූලික අවධානයට පාත්‍ර වී ඇති සංකල්පයකි. මේ අනුව මාධ්‍ය සංස්කෘතිය යන සංකල්පය තවමත් සිය න්‍යායික සහ සංකල්පීය වර්ධනයේ ප්‍රාථමික අවධියේ පසුවන බව ප්‍රකාශ කළ හැකිය (වීරසිංහ, 2015).

බටහිර සංකල්පවේදීන් මාධ්‍ය සංස්කෘතිය යන සුවිශේෂ පාරිභාෂිකය භාවිතයට යොදවන ලද්දේ සමකාලීන බටහිර සමාජයේ (තොරතුරු සමාජයේ) බිහි වූ විශේෂ සංස්කෘතික ස්වරූපයන් අර්ථවත් කිරීම සඳහාය.

මාධ්‍ය (Media) යන පදයෙන් ලතින් භාෂාවෙන් (Medium) අතරමැදියා, මැදිහත්වන්නා, යන්න අර්ථවත් වන අතර, එය දහසය වැනි සියවසේ දී ඉංග්‍රීසි භාෂා ව්‍යවහාරය තුළ දැකිය හැකි අතර, දාහත්වැනි සියවස් වන විට මාධ්‍ය යන සංකල්පය දර්ශනවාදය තුළ නිරීක්ෂණය වන අතර දහඅට වැනි සියවස වනවිට එය සංහතික මාධ්‍යයේ පළමුවැනි ස්වරූපය වන පුවත්පත් හැඳින්වීම සඳහා භාවිත කරන ලද බව පෙනේ. පුවත්පත යනු සංහතික තොරතුරු සම්ප්‍රේෂණයේ ඓතිහාසික ප්‍රථම මාධ්‍ය වන්නේය.

දහනව වැනි සියවස මැද වන විට මාධ්‍ය යන සංකල්පය සමකාලීන අර්ථයෙන් භාවිතයට ගන්නා ලද බව පෙන්වාදිය යුතුය. විශේෂ මාධ්‍ය සම්බන්ධතා පාදකව, ආධාරකව තොරතුරු ව්‍යාප්ත කිරීම, බහුලීකරණය කිරීම, ඉන් අදහස් වේ. තැපැල් සහ විදුලි පණිවිඩ ඊට අයත් විය. වෙළෙඳ ප්‍රචාරක අතරමැදියෙක් වශයෙන් පුවත්පත් අර්ථවත් කිරීම සඳහා මාධ්‍ය යන පාරිභාෂිකය භාවිතයට ගන්නා ලද්දේ විසි වැනි සියවස ආරම්භයේ දීය. දහනව වැනි සියවස අවසානයේ දී පුවත්පත සමාජීය ආයතනයක් බවට පත්විණ.

සන්නිවේදනය යන පාරිභාෂික පදය ලතින් භාෂාවෙන් (Communicare) මගින් බිඳී ආ පදයක් වන අතර එහි අර්ථය වූයේ පොදුකරණය, පොදු බවට පත් කිරීම, සම්බන්ධීකරණය යන්න වන අතර මුලින්ම සන්නිවේදනය යන පාරිභාෂිකය ඉංග්‍රීසි භාෂා ව්‍යවහාරයට එක් වූයේ පහළොස් වැනි සියවසේදීය. ඕනෑම සම්ප්‍රේක්ෂණ, දුනුම් දීම ක්‍රියාවලියක් ඉන් අදහස් විය. දාහත් වැයි සියවස වන විට එය භාවිතයට යොදා ගැනීමේ පරාසය තවත් පුළුල් වූ අතර සම්ප්‍රේක්ෂණයේ සියලු ආකාර, මාර්ග ඉන් අදහස් කරන ලදී. ඊට ප්‍රවාහන මාර්ග සන්නිවේදන මාර්ග ද ඇතුළත් වූ අතර විසි වැනි සියවස වන විට මාධය සහ සන්නිවේදනය අතර අන්තර් සම්බන්ධයක් වර්ධනය වන්න විය. සන්නිවේදනය පාරිභාෂික සංකල්පයක් ලෙස විද්‍යාත්මක ව්‍යවහාරයට ඇතුළු වූයේ 1909 දී ඇමරිකානු සමාජ විද්‍යාඥයෙකු වූ චාල්ස් කූලි

(1864- 1929) ගේ මැදිහත් වීම ඔස්සේය. මානව චින්තන ලෝකයේ අඛණ්ඩ සමස්තය සක්‍රිය කිරීමේ මාධ්‍යයක් ලෙස ඔහු එය නිර්වචනය කළේය.

මාධ්‍ය සංස්කෘතියේ තවත් වැදගත් පාරිභාෂිකයක් වන සංහතික සන්නිවේදනය (Mass Communication) මුලින්ම බිහි වන්නේ විසිවන සියවසේ තුන්වන දශකය අවසානයේදී ය. විශේෂයෙන් විසිවැනි සියවසේ ප්‍රථම අර්ධය තුළ ගුවන් විදුලිය - දෙවන දශකයේ දී ඉන් පසුව රූපවාහිනිය - හතර වන දශකයේදී බිහි වී වර්ධනය වීම නිසා සමාජයට සිදු කරන බලපෑම සහ ඒවා සමාජ ජීවිතය තුළ ඉටු කරන භූමිකාව කැපී පෙනෙන පරිදි වර්ධනය විය. ක්‍රමානුකූලව එම අලුත් සංහතික මාධ්‍යවල ඒකාබද්ධ වීම සහ පුළුල් වීම සමාජ සංවර්ධනයේ නව අවධියක් සනිටුහන් කරමින් සමකාලීන සංහතික මාධ්‍ය සංකල්පයේ ප්‍රසාරණයට හේතු වූ බව ප්‍රකාශ කළ යුතුය. මේ අනුව පුවත්පත් මුද්‍රිත මාධ්‍ය, ශ්‍රව්‍ය මාධ්‍යයක් ලෙස ගුවන්විදුලිය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ලෙස රූපවාහිනී මාධ්‍ය සිනමාව ආදී සියල්ල ඒකීය සමස්තයක් ලෙස හැඳින්වීම සඳහා සංහතික මාධ්‍ය (Mass Media) යන සංකල්පය බිහිවිය (වීරසිංහ, 2014).

සංහතික මාධ්‍ය සහ සංහතික සන්නිවේදනය අතර පාරිභාෂිකාත්මක වෙනසක් පවතී. සමහර අවස්ථාවල දී මේ සංකල්ප ද්වය සමාන පද සඳහා යොදා ගන්නා බව ද සඳහන් කළ යුතුය. නමුත් මෙම සංකල්ප දෙක අතර මූලික වෙනසක් තිබේ. මෙහි පළමු අවස්ථාවේ දී තොරතුරු සම්ප්‍රේක්ෂණ පද්ධතියේ සංකේතාත්මක ස්වභාවය කෙරෙහි අවධානය යොමු කරන අතර දෙවන අවස්ථාවේ දී සමාජයෙහි පුද්ගලයින් ඒකාග්‍ර කිරීමේ, අනුකලනය කිරීමේ සාධකයක් ලෙස එහි සමාජ වැදගත්කම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

විෂයික සන්දර්භයට අනුව මාධ්‍ය යනු විසි වැනි සියවසේ පාරිභාෂිකයක් වන අතර, එය සංහතික සංස්කෘතියේ විවිධ ප්‍රපංච හැඳින්වීම සඳහා ආරම්භක ලෙස භාවිත කරන ලද අතර එය සංස්කෘතියේ ඉතිහාසය සහ න්‍යාය යළි සලකා බැලීම සඳහා පර්යේෂකයන් විසින් භාවිතයට ගන්නා ලදී. මාධ්‍ය නම් වූ නව පාරිභාෂිකයත් සමඟ එය පාදක කොටගෙන සමකාලීන "කලා විචාරය" යන සංකල්පය නිර්මාණය වූ අතර එහි කාර්යය, තත්ත්වය සහ ක්ෂේත්‍රය පෙරට වඩා පළල් සහ බහුවිධ පරාසයක් පුරා පැතිරිණි. කලාව සහ කලාවේ අදහස් සමාජය තුළ ආධිපත්‍ය දරන්නා වූ දෘෂ්ටිවාදය සමඟ ද සමාජ මිථ්‍යාවන් සමඟ ද ආර්ථික කොන්දේසි සමඟ ද සමීප ලෙස සම්බන්ධ බව පෙන්වා දෙමින් විසිවන සියවසේ කලාවේදය තුළ පැවති ප්‍රබල මිත්‍යාවක් වූ නිදහස් කලාකරුවන් සහ කලාව කලාත්මක නිර්මාණකරණයේ ස්වාධීන ක්ෂේත්‍රයක් යන අදහස අවසානාත්මක ලෙස බිඳ දමන ලදී.

මාධ්‍ය සංස්කෘතිය ගවේෂණය කිරීමේ කටයුතුවලට දායක වූ බටහිර පර්යේෂකයින් අතර ආන්රේ බාසේන් (Andreve Basean) රෝලන්ඩ් බාර්ත් (Roland Barthes) වෝල්ටර් බෙන්ජැමින් (Walter Benjamin) ජීන් බ්‍රොඩියිලාර්ඩ් (Jean Baudrillard) ජැක් ඩෙරිඩා (Jacques Derrida) ජිලෙස් ඩිලියුස් (Jilles Deleuse) මාෂල් මැක්ලූහන් (Marshal McLuhan) හර්බට් මාකාස් (Herbert Marcus) මැනුවෙල් කැස්ටෙල්ස් (Manuel Castells) නිකලාස් ලුමන් (Niklas Luhmann) ආදීන් ප්‍රධාන වශයෙන් නම් කළ හැකිය.

වෝල්ටර් බෙන්ජැමින් විද්‍යාව හා තාක්ෂණය නිසා කලාත්මක හා මාධ්‍ය පඨිතවල

සිදු වන තීරණාත්මක වෙනස්කම් රාශියක් පෙන්වා දෙන ලද්දේ විසිවන සියවසේ තුන්වන දශකය තුළදීය. (Benjamin, 1936). තාක්ෂණික ප්‍රතිනිෂ්පාදනයේ අසීමිත හැකියාව නිසා මුල් කෘතිය සහ අනුපිටපත අතර පවතින සංසන්දනාත්මක හා සමාජීය වෙනස්කම් අතුරුදහන් වීමක් සිදු වන බව බෙන්ජමින් පෙන්වා දුන්නේය. මේ තත්ත්වය තුළ කලා කෘතියේ ප්‍රභාව, අද්විතීයභාවය, ගුප්තභාවය, සදාතනිකභාවය, උත්කෘෂ්ටභාවය, සහ ශ්‍රේෂ්ඨත්වය විනාශ වී යන බව ඔහු පෙන්වා දුන්නේය. ප්‍රතිනිෂ්පාදන තාක්ෂණය කලා නිර්මාණ සාම්ප්‍රදායික ක්ෂේත්‍රයෙන් ඈත් කොට එහි අද්විතීයභාවය හා ප්‍රභූභාවය අහිමි කර එය සංහතික හා ප්‍රාථමික දෙයක් බවට පත් කරනු ලබයි. සමකාලීන කලාවේ මූලික ලක්ෂණයක් වන්නේ එය පුද්ගලික ප්‍රීතියේ, වින්දනයේ පරිභෝජනයේ සිට සංහතික පරිභෝජනයේ විහිදී ගිය, බහුවිධ සහ තියුණු ස්වරූප සහ ශෛලීන් දක්වා පරිවර්තනය වීමයි.

නිදර්ශනයක් වශයෙන් රූප දර්ශන තාක්ෂණය (Video technology) රූපවාහිනිය සහ සංදාම රූප දර්ශනය (cable Television) සොයා ගැනීම නිසා සිනමාව නැතිවී නොගිය අතර, ඊට ප්‍රතිවිරුද්ධව සිනමාව නව තවත් සංහතිකකරණයට ලක් වීම ගෙනහැර දැක්විය හැකිය.

සමස්ත මානව ඉතිහාසයේ න්‍යාය සහ ඉතිහාසය ප්‍රතිඅර්ථකථනයට භාජනය කළ කැනේඩියානු සංස්කෘතිකවේදියෙකු සහ විචාරකයෙකු වූ මාෂල් මැක්ලූහන් විසිවැනි සියවසේ මැද භාගයේ මාධ්‍ය න්‍යාය වර්ධනය කළ එක් පුරෝගාමී පුද්ගලයෙකු ලෙස සමකාලීන මාධ්‍ය සංස්කෘතියේ ප්‍රවර්ධනයට සිදුකළ දායකත්වය සුවිශාලය. නූතන සංහතික විඥාපන මාධ්‍ය මගින් සංස්කෘතිය තුළ ඇති වූ අලුත් සන්නිවේදන නාලිකා හා සමාජයෙහි මිනිසුන්ගේ දෛනික ජීවිතය නව මානයකින් විශ්ලේෂණය කිරීම මැක්ලූහන් විසින් ආරම්භ කරමින් සමකාලීන මාධ්‍ය සංස්කෘතිය අවබෝධ කර ගැනීම සඳහා නව ක්‍රමවේදයක් මෙන්ම ඊට අවශ්‍යයික න්‍යායික-සංකල්පීය රාමුවක් ද නිර්මාණය කළේය.

විශේෂයෙන් ලෝක මාධ්‍ය සහ සංහතික ඉතිහාසය තුළ මාධ්‍ය යන පාරිභාෂිකය මුලින්ම භාවිතයට ගත් එක් පුරෝගාමියෙකු වූයේ මාෂල් මැක්ලූහන් ය. විවිධ සන්නිවේදන නාලිකා, මාර්ග අධ්‍යයන සන්දර්භය තුළ ඒකීය සමස්තයක් ලෙස හැඳින්වීම සඳහා මාධ්‍ය යන භාවිතය ඔහු යොදා ගන්නා ලදි.

මානව ශක්‍යතා, හැකියා තාක්ෂණික ලෙස බහිෂ්කරණය (exclusion) වීම මූලික රූපකයක් ලෙස මැක්ලූහන් තේරුම් ගත්තේය. සන්නිවේදනයේ සියලු ස්වරූප, මාර්ග, ක්‍රියාකාරී රූපක බව ඔහු අවධාරණය කළේය. ඕනෑම රූපකයක ප්‍රධාන කාර්යය වන්නේ ලෝකය විස්තර කිරීමයි. මාධ්‍යයේ භාෂාව අනෙක් වෙනත් ඕනෑම භාෂාවක් සේම තාක්ෂණයකි. කලාකරුවා ජාතියේ සංඥා ග්‍රාහකය (Antena) බව පසක් විය යුතුය. කලාකරුවා යනු රූපක පාලනය කරන්නාය.

එසේම මැක්ලූහන්ගේ සංස්කෘතික වර්ගීකරණය එතෙක් කල් ආධිපත්‍ය දරන ලද නිල පිළිගත් සංස්කෘතියේ න්‍යාය විපරිවර්තනයකට ලක් කළේය. මැක්ලූහනියානු සංස්කෘතික සංකල්පයේ න්‍යායික පදනම බවට පත් වූ මූලික අදහස වූයේ මානව සංස්කෘතියේ පදනම මාධ්‍ය මත පිහිටා ඇති බවත්, ඒ ඒ සමාජවල මූලික ස්වභාවය අදාළ යුගයේ ප්‍රමුඛ වන ආධිපත්‍ය දරන මාධ්‍යයන්ගේ මාධ්‍ය ස්වභාවය, එහි ගති ලක්ෂණවලට අනුකූලව ගොඩනැගෙන බවත්ය. මෙම මැක්ලූහන්වාදී අදහස එතෙක් කල් සංස්කෘතිය පිළිබඳ වූ මාක්ස්වාදී අදහසට එල්ල වූ දැඩි විවේචනයක්

පමණක් නොව, ඊට විකල්පයක් බවට ද පත් විය. සංස්කෘතිය පිළිබඳ මාක්ස්වාදී සංකල්පය වූයේ අදාළ සමාජයේ අධෝ ව්‍යුහය මගින්, ආර්ථිකය මඟින් එහි උපරි ව්‍යුහයේ සංරචකයක් වශයෙන් සංස්කෘතිය නිර්ණය වන බවයි.

මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ මැක්ලුහනියානු සංකල්පය ප්‍රධාන වශයෙන් මාධ්‍ය කේන්ද්‍රීය ප්‍රවණතාවක් ගන්නා අතර, මාධ්‍යයන්ගේ ඓතිහාසික වර්ධනයට සමරූපීයව සංස්කෘතිය පමණක් නොව, සමාජයේ ස්වභාවය ද වෙනස් වන බව මැක්ලුහන් පෙන්වා දෙන්නේ මධ්‍යම සන්දර්භය වේ (Mcluhan, 1960).

කාල් මාක්ස්ට අනුව ඓතිහාසික ක්‍රියාවලියේ ප්‍රධාන ගාමක බලවේගය වන්නේ නිෂ්පාදන බලවේග සහ නිෂ්පාදන සම්බන්ධතා අතර ප්‍රතිවිරෝධතාවයි. මාෂල් මැක්ලුහන් පෙන්වා දෙන්නේ ඓතිහාසික ක්‍රියාවලියේ සහ සමාජයේ මෙන් මානව චින්තනයේ ගාමක බලවේගය වන්නේ නව සන්නිවේදන මාධ්‍යයන් නිර්මාණය කිරීමට සමත් තාක්ෂණය බවයි. ප්‍රගතියට පාදක වන මූලික ප්‍රතිවිරෝධතාව ලෙස මැකලුහන් දකින්නේ පැරණි සන්නිවේදන මාධ්‍යයන් සහ නව සන්නිවේදන මාධ්‍යයන් අතර ප්‍රතිවිරෝධතාව මිස ධනපති පන්තිය හා නිර්ධන පන්තිය අතර ගැටුම් නොවන බවයි.

මැක්ලුහන්ගේ මාධ්‍ය සංස්කෘතික සංකල්පයට අනුව මානව ශිෂ්ටාචාරයේ වර්ධනය මූලික සංස්කෘතික අවධි ත්‍රිත්වයකට බෙදා දැක්විය හැකිය (Mcluhan, 1962). ඉන් පළමු වැන්න ප්‍රාථමික ප්‍රාග් ලිඛිත සංස්කෘතික අවධිය වන අතර, මෙහි විශේෂය වන්නේ මිනිසා විසින් සිය අවට ලෝකය සංජානනය කර ගන්නේ සහ අවබෝධ කර ගන්නේ සාමූහික ජීවන මාදිලියේ මූලධර්මවලට අනුකූලවය. එම සමාජ මාදිලියේ ජීවිතය හා සංස්කෘතිය මූලික වශයෙන් වාචික සන්නිවේදන මාධ්‍යය මගින් තත්ත්වාරෝපණය කරන ලදී. මැක්ලුහන්ට අනුව එම සමාජය තුළ ආධිපත්‍ය දරන ලද්දේ ශ්‍රව්‍ය සංස්කෘතිය (Ear Culture) යි. මෙම සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ අතර සමක්ෂණිකතාවය හෝ සමකාලත්‍වය (Simultaneity) සහ චක්‍රකතාව (Circularity) නිමග්නය (Immersion) කැපී පෙනේ. මෙම ප්‍රාග් ලිඛිත සංස්කෘතිය තුළ සන්නිවේදනයේ, සමාශ්‍රයේ මූලික ස්වරූපය ලෙස ඉදිරිපත් වන්නේ කතාවයි. වාචික ලෝක ඒකීය විද්‍යාපන, තොරතුරු හා භාවිත අවකාශය ලෙස ඉදිරිපත් වේ. සියලු හැඟීම්, දැකීම්, ශ්‍රවණය, ස්පර්ශය භාවිත වින්දනය හා ආඝ්‍රාහණය ඒකීය සමස්තයක් නියෝජනය කරන්නේය.

මෙම ප්‍රාග් ලිඛිත සංස්කෘතියෙන් පසුව ලිඛිත-මුද්‍රිත සංස්කෘතික අවධිය උදා වූ අතර හෝඩිය බිහි වීම, ලේඛනය ව්‍යාප්ත වීම හා පාඨනය ප්‍රචලිත වීම ආදිය නිසා වාචික සංස්කෘතිය ලෙස තවදුරටත් පවත්වා ගෙන යා නොහැකි විය. මෙම සමාජයෙහි මිනිසුන් පාඨක සහ අපාඨක වශයෙන් දෙකොටසකට බෙදුණි. මෙම සංස්කෘතිය තුගත් අයගේ දෘෂ්ටිකෝණයෙන් ප්‍රභූ සංස්කෘතියක් බවට පෙනී ගියේය. ක්‍රමානුකූලව ශ්‍රව්‍ය-ධ්වනික අවකාශය දෘශ්‍ය අවකාශය බවට පරිවර්තනය විය. ලොව පුරා ලිඛිත මුද්‍රිත මාධ්‍ය සමග එම සංස්කෘතිය ව්‍යාප්ත වීමත් සමග ශික්ෂණවේදය, පුද්ගලවාදය, ජාතිකවාදය ආදී ප්‍රවණතා සමාජය තුළ බිහි වී ප්‍රබල වන්නට වූ බව මැක්ලුහන් ප්‍රකාශ කරයි. මෙම ලිඛිත-මුද්‍රිත සංස්කෘතියේ අවසාන ප්‍රතිඵලය වූයේ මුද්‍රණාක්ෂර හා කාර්මික මිනිසා බිහි වීමයි.

මැක්ලුහන්ගේ මාධ්‍ය සංස්කෘතික සංකල්පයේ තුන්වන හෙවත් අවසාන අවදිය වන්නේ දෘශ්‍ය සංස්කෘතික අවධියයි. මෙම සංස්කෘතික අවධියේ පදනමේ වන මූලික සංරචකය ලෙස විදුලි බලය දකින මැක්ලුහන් එය මුළු ලෝකයේම ජීවත් වන මිනිස්සු



6-CM 27591

ක්ෂණිකයකින් එකට එකතු කිරීම හැකි බලයකි. රාත්‍රි කාලය හා දිවා කාලය අතර වෙනස නැති කරන අතර, මුළු ලෝකයම ''විශ්ව ගම්මානයක්'' බවට පත් කරන බව ඔහු අවධාරණය කළේය.

මැක්ලුහන්ට අනුව විද්‍යුත් මාධ්‍ය සන්නිවේදනයේ පිහිටෙන් සමකාලීන සමාජය ප්‍රාථමික සමාජ බවට පත් කරන්නේය. ස්වභාවික ශ්‍රව්‍ය-දෘශ්‍ය බහුමානික ලෝක සංජානනය සහ සාමුහික හැඟිම නව ජීවයක් ලබන්නේය. විද්‍යුත් මාධ්‍ය සන්නිවේදනය විදුලි පණිවුඩ, දුරකථනය, රූපවාහිනිය, පරිගණකය ආදිය මැක්ලුහන් දකින්නේ මිනිසාගේ ස්නායු පද්ධතියේ දිගුවක්, ප්‍රසාරණයක් ලෙස වන අතර, එය මිනිසාගේ මානසික, සමාජ සංස්කෘතික ජීවිතය ප්‍රතිසංස්කරණය කරන්නේය. විපරිවර්තනය කරන්නේය. නව ගෝත්‍රික මිනිසාගේ යුගයෙහි මිථ්‍යාව ආධිපත්‍ය දරන ලද අතර, සංහතික විඥාපන මාධ්‍යයන්ගේ ආධාරයෙන් සියලු සංස්කෘතීන්ගේ භාවිත දේශගුණය පාලනය සිදු කළ හැකි බව ඔහු පෙන්වා දුන්නේය.

මැක්ලුහන්ගේ මාධ්‍ය සංස්කෘතික සංකල්පයට අනුව මාධ්‍ය නම් සංකල්පයට සංහතික තොරතුරු සන්නිවේදන මාධ්‍ය පමණක් නොව, ඊට විදුලි ආලෝකය, වාචික භාෂාව, ලේඛනය, මාර්ග සංඛ්‍යා, ඇඳුම් පැලඳුම්, නිවාස, නගර, මුදල්, ඔරලෝසු, මුද්‍රණය. පොත්, වෙළෙඳ දැන්වීම්, ප්‍රවාහනය, කාර්, ගුවන්යානා, ස්වංක්‍රීය උපකරණ, ඡායාරූප, ක්‍රීඩා විදුලි පණිවිඩ, දුරකථන, සිනමාව, ගුවන් විදුලිය, රූපවාහිනිය, ආයුධ ආදී තවත් බොහෝ දෑ ඊට ඇතුළත් වේ (Mcluhan, 1964). මේ සියල්ල එකට ඒකාබද්ධව තාක්ෂණය යන වචනයට ඇතුළත් කරන මැක්ලුහන් මේවා භාවිතයට ගැනීම තුළ බාහිර ලෝකය සමග මිනිසා සිදු කරන සන්නිවේදනයේ වෙනස්කම් සිදුවන බව ඔහු ප්‍රකාශ කරයි. මෙම මාධ්‍ය මැක්ලුහන් සඳහන් කරන්නේ මිනිසාගේ බාහිර ප්‍රසාරණයක්, විහිදීමක් දිගුවක් ලෙසිනි. මිනිසාගේ දේහයේ, පංචේන්ද්‍රියන්ගේ සන්වේදනවල සහ ශක්‍යතාවල සෘජු තාක්ෂණික ප්‍රසාරණයක්, දිගුවක්, ව්‍යාප්තියක් ලෙස සිදු වීමට සමාන්තරව ඒවා මිනිසාගෙන් ඉවත් වී පරාරෝපණය වී, අන් සතු වී ඒවාම මිනිසාට එරෙහිව බාහිර බලයක් ලෙස ක්‍රියා කරයි. මේ ආකාරයට මාධ්‍ය මිනිසාගෙන් පරාරෝපණය වීම මාෂල් මැක්ලුහන් උපමාත්මකව හඳුන්වන්නේ අංගඡේදනය (Ampulation) වශයෙනි.

වර්තමාන මාධ්‍ය සංස්කෘතියේ සිදුවන පුළුල් සහ ගැඹුරු ක්‍රියාකාරකම් අවබෝධ කර ගැනීම සඳහා මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ මැක්ලුහනියානු සංකල්පය යොදා ගත හැකියි. අද්‍යතන සංහතික මාධ්‍ය තාක්ෂණයේ මාධ්‍ය හා තාක්ෂණිකවේදයේ සහ සංහතික මාධ්‍ය පයීත අන්තර්ගතයන්ගේ බලපෑම නිසා එක් අතකින් පුද්ගලයා සිය ස්වභාවික සහ සමාජීය හැකියාවලින් පරාරෝපණය වන අතර, අනෙක් අතින් සමාජයේ සදාචාරාත්මක, බුද්ධිමය මට්ටම වේගයෙන් අහිමි කර ගනිමින් සිදු වන්නේ මාධ්‍ය සහ මාධ්‍ය සංස්කෘතිය සිය ආරම්භයේ සිටම මිනිස් මනස, විඥානය අත්පත් කර ගැනීමේ පැහැර ගැනීමේ ප්‍රයත්නයක යෙදෙන බව පෙනේ. සංහතික සන්නිවේදන සහ මාධ්‍ය තාක්ෂණයේ යටිතල පහසුකම් වර්ධනයේ සහ ව්‍යාප්තියේ ඓතිහාසික ප්‍රවණතාව පෙන්වා දෙන්නේ ඊට සමාන්තරව පුද්ගල සහ සමාජ නිර්මාණාත්මක ශක්‍යතා, හැකියා කප්පාදු කරමින් මිනිසා සහ සමාජය යාන්ත්‍රික සහ ස්වයං ක්‍රියාකාරී ප්‍රපංචයක් බවට පත් කර ඇති බවයි.

මානව සමාජ පරිණාමය උපරි සමාජ පරිණාමීය අවදියට ප්‍රවිෂ්ටව ඇත. මේ යුගයේ

දී මාධ්‍ය සංස්කෘතිය සහ මානව විඥානය, සමාජ විඥානය අතර අන්තර් සම්බන්ධතාව පිළිබඳ ප්‍රශ්නය ඉතා සංකීර්ණ අර්බුදාත්මක ස්වභාවයක් ගෙන ඇත. සමකාලීන සංහතික මාධ්‍ය සංස්කෘතියේ තාක්ෂණික සහ තාක්ෂණවේදී වර්ධනයේ සංඛ්‍යාංක අවධියේත් සමාජ-සංස්කෘතික පරිණාමයේ උපරි සමාජ අවධියේත් ප්‍රතිඵලයක් වශයෙන් සංක්‍රාන්තික මානවවාදී සහ පශ්චාත් මානවවාදී තත්ත්වයක් නිර්මාණය වී ඇති අතර මෙහිදී මානව විඥානය සම්පූර්ණයෙන් ම අංගච්ඡේදනය වීමේ අනතුර පිළිබඳව අද්‍යතන මාධ්‍ය සංස්කෘතික පර්යේෂකයින්ගේ අවධානය යොමුව ඇති බව සඳහන් කළ යුතුය. මෙහි අර්ථය වන්නේ මිනිසා සිය ස්වභාවික තත්ත්වයෙන් හා සීමාවෙන් ඔබ්බට ගෙන යෑම සඳහා සමකාලීන මාධ්‍ය සංස්කෘතිය ඉවහල් වී ඇති බවයි. මීට අමතරව සමකාලීන සංහතික මාධ්‍ය සංස්කෘතියේ ප්‍රතිඵල, සංකල්පීය භාණ්ඩ පරිභෝජනය කිරීම නිසා මිනිසා පශ්චාත් මිනිසෙක් බවට පත්වීම වර්තමානයේ අප සමාජය තුළ කැපී පෙනෙන ප්‍රවණතාවකි. මෙම පරාරෝපිත තාක්ෂණික යටිතල පහසුකම් අබියස මිනිසා දුර්වල, පරාධීන හා යාන්ත්‍රික පැවැත්මක් බවට පත් වෙමින් ඊට සරිලන තර්කනයකට අනුකූලව හැසිරෙමින් මිනිසා සහ සමාජය සමග සිදු වෙමින් පවතින දේ පිළිබඳ අනවබෝධයෙන් පසුවෙමින් අවසාන වශයෙන් තමාට තමාව අහිමිව යන්නේය.

සාම්ප්‍රදායික අර්ථයෙන් මාධ්‍ය සංස්කෘතිය යන අදහසට ශ්‍රව්‍ය-දෘශ්‍ය කලාවේ සියලුම ස්වරූප සහ ප්‍රභේද ඇතුළත් විය. නමුත් ෆෙඩ්රික් ජේම්සන් (Fredric Gameson) සහ ජේන් බෝඩ්‍රිලාර්ඩ් (Jean Baudrillard) ට අනුව මාධ්‍ය යනු සමකාලීන තාක්ෂණික මාදිලි පාදකව හඬ සහ නිරූපණ රූපක පටිගත කිරීම සහ සම්ප්‍රේක්ෂණය නිසා පුළුල් ව්‍යාප්තියක් අත්පත් කරගෙන ඇති ගතික රූපක ස්වරූප සම්ප්‍රේක්ෂණය සමග සම්බන්ධ සංස්කෘතියේ ක්ෂේත්‍රයකි. මැක්ලුහන්ට වඩා ධනවාදී සමාජයෙහි සංස්කෘතික පරිණාමය දෙස තියුණු මාක්ස්වාදී ඇසකින් බැලූ ෆෙඩ්රික් ජේම්සන් එහි සාහිත්‍ය, කලාව මාධ්‍ය කෙරෙහි සුවිශේෂ පර්යාලෝකයක් සමග අර්ථකථනය කරමින් ඒවා පශ්චාත් - නූතනවාදය හෙවත් පසු - ධනවාදයේ සංස්කෘතික තර්කනය නම් ප්‍රවාදයට අනුව ගෙනහැර දක්වීය. යථාර්ථවාදය 19 වැනි සියවසේ ධනවාදයෙහි සාහිත්‍යමය මාදිලිය ලෙස ද, නූතනවාදය 20 වැනි සියවසේ මුල් භාගයේ ද්‍රව්‍යකරණය වූ කාර්මික ධනවාදයේ ප්‍රකාශනය ලෙස දපශ්චාත් නූතනවාදය පසු ධනවාදී ගතිගත්වයන්ගේ සෞන්දර්ය සහ පඨිතමය මට්ටම්වල ප්‍රකාශනයක් ලෙස ද පෙන්වා දෙමින් සංස්කාතිය ඇතුළු සංහතික මාධ්‍ය සංස්කෘතිය ඒ ඒ යුගවල දී ප්‍රකට කරන ශෛලීන්, අකෘති, හැඩතල, රූපක සහ ස්වරූප ඍජුව සමාජ - ආර්ථික සහ ඓතිහාසික තත්ත්වයන්ට සම්බන්ධ බව පෙන්වා දුන්නේය (Jameson, 1991). සමකාලීන සංහතික මාධ්‍ය සංස්කෘතිය බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස මිනිසා යථාර්ථය කෙරෙහි වූ සාම්ප්‍රදායික සම්බන්ධතාව අහිමිකර ගෙන තිබේ. වර්තමාන සංස්කෘතියෙහි මිනිසා ජීවත් වන්නේ දේවල්වලින් පිරුණු ලෝකයක නොව සංඥාවලින් පිරුණු ලෝකයක ය (Baudrillard, 1994). සමකාලීන සංහතික මාධ්‍ය සංස්කෘතියේ නැගීම සමගම මානව වර්ගයාගේ සංස්කෘතියේ ස්වර්ණමය යුගය අවසාන වූයේය. ඇත්ත වශයෙන් ම සංස්කෘතික අධ්‍යයන න්‍යාය තුළ මාධ්‍ය සංස්කෘතියට පුළුල් ව්‍යාප්තියක් ලැබුණේ විසිවැනි සිවසේ අවසානයේ දී බව සිහිපත් කළ යුතුය.

ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍ය පඨිත නිර්මාණය කරනු ලබන්නේ විවිධාකාරයේ තොරතුරු

සම්ප්‍රේක්ෂණය සඳහා වේ. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය පදීනයන් ශබ්ද ධ්වනික, වාචික නිරූපණ සංකේතාත්මක සමූහයක් ලෙස එකට ඒකාබද්ධ කරන්නේය. සමකාලීන සන්දර්භය තුළ ශ්‍රව්‍ය දෘශ්‍ය සංස්කෘතිය යනු සංස්කෘතික තොරතුරු සටහන් කිරීමේ හා සම්ප්‍රේක්ෂණය කිරීමේ මාදිලියක් වන අතර, මෙය පෙර ආධිපත්‍ය දරන ලද වාච්‍ය-ලිඛිත සන්නිවේදනය පෝෂණය කරන්නා වූ මාදිලියක් නොව, එය විතැන් කරන්නා වූ මාදිලියකි.

මාධ්‍ය සංස්කෘතියේ විශේෂත්වය නිර්ණය වන්නේ එහි සංඥාර්ථවේදාත්මක ස්වභාවය සහ මාධ්‍ය සංස්කෘතිය සාක්ෂාත්කරණයෙහිලා මාධ්‍ය සතු තාක්ෂණිය හැකියාවයි. මාධ්‍ය සංස්කෘතියේ විශේෂත්වය ප්‍රකට කෙරෙන මූලික ලක්ෂණ අතර උසස් තොරතුරු අවකාශය, රූපක සංජානනයේ සරල සහ විශ්වාසනීයත්වය, ප්‍රතිඵලදායිත්වය අභිබවා ඵලදායිත්වයේ ප්‍රමුඛතාව, සම්ප්‍රේක්ෂණයේ පුළුල් බව සහ ශීඝ්‍රතාව, බහුලීකරණය හා පිටපත්කරණය,සංහතිකත්වය හා සමීපත්වය ප්‍රධාන වේ. අප මේ ඉහත දක්වන ලද සියලු ලක්ෂණ මාධ්‍ය සංස්කෘතියේ සමාජ-සංස්කෘතික කාර්යයන් හැඩගැස්විම සඳහා පාදක වේ.

සමකාලීන සංහතික මාධ්‍ය සංස්කෘතිය අවබෝධ කර ගැනීම සඳහා පියේර් බෝර්ඩියු (Pierre Bourdieu) නම් වූ ප්‍රංශ සමාජ විද්‍යාඥයාගේ පරිචිතිය (Haditus) සංකල්පය ඉතා වැදගත් වේ. විවිධ සමාජ පරිසරවල වඩාත්ම ගැඹුරේ නිලීනව ඇති ව්‍යුහ බෝර්ඩියු පැහැදිලි කරමින් එය ප්‍රධාන වශයෙන් සමස්ත කාල අවකාශය සංයුක්ත කරන බව පෙන්වා දුන්නේය. එසේම එම සමාජ කාල අවකාශය ප්‍රතිනිෂ්පාදනයට සහ එය වෙනස් කිරීමට අවශ්‍ය යන්ත්‍රණයක් වශයෙන් ද ක්‍රියාකරන බව ඔහු අවධාරණය කළේය. එම සමාජ කාල අවකාශයේ විශේෂත්වය වන්නේ එහි ව්‍යුහ උත්පාදනය ද්විත්ව ස්වරූපයක් ගැනීමයි. එනම් ද්වි අර්ධ ව්‍යුහයක් දරන්නේය. ඉන් පළමු වැන්න ''ප්‍රථම පටිපාටියේ යථාර්ථය'' වේ. ප්‍රථම පටිපාටියේ යථාර්ථය ගණයට සමාජය තුළ ද්‍රව්‍යමය වටිනාකම් අත්පත්කර ගැනීම සහ ද්‍රව්‍යමය සම්පත් බෙදා හැරීම ඔස්සේ සිදු වන්නේය. ''ද්විතීයික පටිපාටියේ යථාර්ථය'' අදහස් වන්නේ හැසිරීමේ හා චින්තනයේ රටාවල පවතින්නා වූ ආකල්පයන්ය. එනම් එය ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයේ සංකේතාත්මක මාතෘකයයි.

බෝර්ඩියුගේ පාරිභාෂික භාවිතය තුළ මාධ්‍ය සංස්කෘතිය අර්ථවත් කරන්නේ නම් විවිධාකාර ප්‍රාග්ධන අන්තර් ස්වරූප ඔස්සේ සංකේතාත්මක ප්‍රාග්ධනය බවට පරිවර්තනය කිරීමේ අවකාශය සහ මාදිලිය මාධ්‍ය සාක්ෂරතාවය ලෙස හැඳින්විය හැකිය. සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර මහජනතාවට බලපෑමක් කළ හැකි ජනප්‍රිය සංහතිකාර්ෂණිය යම් මාධ්‍යයක් පෙනී සිටිය හැකිය. මෙහි දී මූලික වන්නේ මහජනතාව අතර ජීවන ආස්ථානය සහ ජනමතය හැඩගැස්වීමේ යන්ත්‍රණයයි. මේ අනුව සමකාලීන මාධ්‍ය සංස්කෘතිය, විශේෂයෙන් ශ්‍රව්‍ය-දෘශ්‍ය සංස්කෘතිය ප්‍රාග්ධනය පරිවර්තනය කිරීමේ තාක්ෂණයේ එක් ප්‍රමුඛ කාර්යයකි (Bourdreu 1986).

වර්තමාන සංහතික මාධ්‍යයන්ගේ ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජ යථාර්ථය, තථ්‍යසන්න යථාර්ථය (Virtual Reality) බවට පරිවර්තනය වන බව ස්ලැවෝජ් ජිජැක් (Sanoj Zizek) පෙන්වා දෙන්නේය. වර්තමාන සංස්කෘතිය සර්වාධිකාරිව හා සර්වභෞමික මාධ්‍යකකරණයට (Mediati Zation) වන බව ජිජැක් අවධාරණය කරන්නේ සමකාලීන මිනිසා සංහතික මාධ්‍ය සංස්කෘතිය තුළ ගිලෙමින් නව මාධ්‍යයේ නිෂ්පාදිතයක් බවට

පත් වන්නේය. මාධ්‍යකරණය යන යථාර්ථවාදී දෑ කෘතිම දෑ බව පරිවර්තනය වීමේ ක්‍රියාවලියයි (Zizek 1998).

වර්තමාන මාධ්‍ය යනු එහි හුදු සංහතික විඥාපන මාධ්‍ය පද්ධතිය සහ සංහතික සන්නිවේදනය පමණක්ම නොව, එය නිශ්චිත බල පාලන මාතෘකයකි. එනම් අද්‍යතනයේ ඕනෑම රාජ්‍යයක මූලික පදනම නිර්මාණය කරන සංස්කෘතික විඥාපන ඒකාධිකාරී පද්ධතියකි. සංඛ්‍යාංක යුගයේ මාධ්‍ය සංස්කෘතියේ විශේෂත්වය වන්නේ එය විඥාපන තොරතුරු ප්‍රවාහයේ සූක්ෂමත්වය බාහිර, අවට ලෝකය මිනිසා විසින් විවිධ පැතිකඩ ඔස්සේ තේරුම් ගැනීමයි. එනම් බාහිර ලෝකය පිළිබඳ සමකාලීන මිනිසා සමාජීය, සංස්කෘතික, සදාචාරාත්මක, ආචාරධර්මීය, මානසික, කලාත්මක, සෞන්දර්යාත්මක, බුද්ධිමය පමණක් නොව ප්‍රායෝගික, ව්‍යවහාරික පැතිකඩ පිළිබඳ අවබෝධය, දැනීම ලබා දෙන සමාජ ආයතනයක් බවට පත් වී තිබේ. මාධ්‍ය සංස්කෘතිය යනු මාධ්‍ය ක්ෂේත්‍රයෙහි ආධ්‍යාත්මික සහ ද්‍රව්‍යමය වටිනාකම්වල සමස්තය වේ. මාධ්‍ය සංස්කෘතිය යනු එම වටිනාකම් නිෂ්පාදනය කිරීමේ ක්‍රියාත්මක වීමේ ඓතිහාසික පද්ධතියකි.

මේ අනුව මාධ්‍ය සංස්කෘතිය යනු මානව වර්ගයා විසින් සිය සංස්කෘතික - ඓතිහාසික ක්‍රියාවලියේ දී පුද්ගල සමාජානුයෝජනය සහ සමාජ විඥාපනය හැඩ ගැස්වීම සඳහා උපස්ථම්භක වන පරිදි නිර්මාණය කර ගන්නා ලද විඥාපන (තොරතුරු) සන්නිවේදන පද්ධතියකි. මාධ්‍ය සංස්කෘතියට සංහතික තොරතුරු නිෂ්පාදන හා ප්‍රතිනිෂ්පාදන, සංස්කෘතික තොරතුරු සම්ප්‍රේක්ෂණය, සංස්කෘතික තොරතුරු සංජානනය කිරීමේ සංස්කෘතිය එසේම, මාධ්‍ය ඔස්සේ නව දැනුම අත්පත් කර ගැනීමේ හැකියාව, මාධ්‍ය නිර්මාණකරණයේ යෙදීමට ඇති හැකියාව,මාධ්‍ය පඨිත කියවීමේ, විශ්ලේෂණය කිරීමේ, ඇගයීමේ අවබෝධනයේ කුසලතාව ආදිය ඇතුළත් වන අතර ඒවා පාදකව මානව සංවර්ධනයක් සිදුවේ. මේ අනුව මාධ්‍ය සංස්කෘතිය පෞරුෂ සංවර්ධන මට්ටමේ පද්ධතියක් ලෙස ඉදිරිපත් වන බව පෙන්වාදිය හැකිය. මානව සමාජ පරිණාමයේ දෘෂ්ටිකෝණයට අනුව මාධ්‍ය සංස්කෘතියේ වර්ධනය සමාජ, ආර්ථික, සංස්කෘතික සහ ඓතිහාසික සාධක මත තත්වාරෝපිතව සිදුවන නියමානුකූල ක්‍රියාවලියකි.

මාධ්‍ය සංස්කෘතිය සමාජය තුළ යම් නිශ්චිත කාර්යය පද්ධතියක් ද ඉටු කරනු ලැබේ. මාධ්‍ය සංස්කෘතිය සමාජය තුළ ඉටු කරන කාර්යභාරය සමාජීය කාර්යභාරයක් ලෙස මූලික වශයෙන් හැඳින්විය හැකිය. තොරතුරු (විඥාපන) කාර්ය, සන්නිවේදනාත්මක කාර්ය, දෘෂ්ටිවාදී කාර්ය, ප්‍රතිෂ්ඨාපන කාර්ය, නිර්මාණාත්මක කාර්ය, අනුකලනාත්මක කාර්ය, අතරමැදිකාර්ය, ස්වභාව ධර්මයට කළ නොහැකි මිනිසාට, සමාජයට තොරතුරු, දැනුම ආදිය ඉදිරිපත් කිරීමේ කාර්ය සමකාලීන මාධ්‍ය සංස්කෘතිය මගින් ඉටු කරනු ලැබේ. විශේෂයෙන් ම මාධ්‍ය සංස්කෘතිය සමාජීය තොරතුරු සමාජය වෙත සම්ප්‍රේක්ෂණය කරනු ලැබේ. මාධ්‍ය සංස්කෘතිය නිසා සමාජය තුළ තොරතුරු සංචිත වීම, ඒකරාශී වීම, බෙදාහැරීම, හුවමාරුව සහ පාරිභෝජනය සිදුවේ.

මාධ්‍ය සංස්කෘතිය යනු එය සමාශ්‍රමය අන්‍යෝන්‍ය ක්‍රියාකාරී ක්‍රියාවකි. මාධ්‍ය සංස්කෘතිය මිනිසුන් මිනිසුන් අතර ද මිනිසුන් සමාජය සමග ද, පාලනය සමාජය සමග ද විවිධ රටවල් අතර ද ජාතීන් අතර ද සමාජ කණ්ඩායම් අතර ද සමාශ්‍ර සහ සන්නිවේදන කාර්යයන් සිදු කරනු ලැබේ. විශේෂයෙන් සංස්කෘතීන් අතර සංවාදයක් ඇති කිරීම සඳහා

මාධ්‍ය සංස්කෘතියේ සන්නිවේදනාත්මක කාර්ය ඉතා වැදගත් වන්නේය.

මාධ්‍ය සංස්කෘතියේ දෘෂ්ටිවාදී කාර්යයේ දී පුද්ගල සමාජානුයෝජනය පෙර පරම්පරාවල දැනුම, අත්දැකීම් ඥානය, ප්‍රතිමාන, අදහස්, පරමාදර්ශ අත්පත් කර ගැනීමෙහිලා සුවිශාල දායකත්වයක් ඉටු කරනු ලබන්නේ මාධ්‍ය සංස්කෘතියේ දෘෂ්ටිවාදී කාර්ය මගිනි.

මාධ්‍ය සංස්කෘතියේ සෙසු කාර්ය මිනිසා සහ සමාජය භාවිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කායිකව මෙන්ම මානසිකව විඩාවට පත්වන අවස්ථාවලදී මාධ්‍යයේ ප්‍රතිෂ්ඨාපන හෝ විනෝදාස්වාදී කාර්ය මගින් ඒ තත්ත්වය නැතිකර යථා තත්ත්වයට පුද්ගල සහ සමාජ තොරතුරු සංජානන තත්ත්ව පත් කරලීම විනෝදාස්වාදී කාර්යෙහි ප්‍රමුඛම කර්තව්‍ය වේ. විශේෂයෙන් ම සමකාලීන මාධ්‍ය සංස්කෘතියේ ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය මගින් මෙම කාර්යය ඉටු කරනු දැකිය හැකිය.

මාධ්‍ය සංස්කෘතියේ නිර්මාණාත්මක කාර්ය මගින් පුද්ගලයින්ගේ සමාජ, සංස්කෘතික, දේශපාලන සහ දෛනික ව්‍යවහාරික අත්දැකීම්, දැනුම, පෝෂණය කරමින් එය සමාජ, ආර්ථික, දේශපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට දායක කිරීම සිදු වන්නේ ය. පුද්ගලයා රට, ලෝකය, සමාජය, ස්වභාවධර්මය පිළිබඳ සිය දැනුම වර්ධනය කරගන්නේය. මාධ්‍ය සංස්කෘතියට පුද්ගලයින්ගේ පටු සීමා පුළුල් කර ඔවුන්ගේ ලෝකාවලෝකනය සහ ලෝකදෘෂ්ටිය පුළුල් කිරීමේ ශක්‍යතාවක් පවතී.

මාධ්‍ය සංස්කෘතියේ අනුකලනාත්මක කාර්යයේ දී ජාතීන්, සමාජීය කණ්ඩායම්, රාජ්‍යයන් ඒකාබද්ධ කිරීමට ඇවැසි ක්‍රියාකාරකම් රාශියක් ඉටු කරනු ලැබේ. ජාතික සම්ප්‍රදායන්, ඓතිහාසික ස්මරණයන් මගින් මිනිසුන් අතර මෙන්ම ජාතීන් හා රටවල් අතර සම්බන්ධතා නිර්මාණය කරන්නේය. එසේම විවිධ පරම්පරා අතර සහජීවනාත්මක සම්බන්ධතා ගොඩනගන්නේ විශේෂයෙන් ම බහු වාර්ගික, බහු ජාතික, බහු සංස්කෘතික, බහු ආගමික සමාජයකට මාධ්‍ය සංස්කෘතියේ අනුකලනාත්මක කාර්ය අතිශයින් ම වැදගත් වන්නේය. මාධ්‍ය සංස්කෘතියේ අනුකලනාත්මක කාර්ය යොමුව ඇත්තේ ජාතික හෝ වාර්ගික සංස්කෘතික අනන්‍යතාවය විනාශ කිරීම කෙරෙහි නොව විවිධ සංස්කෘතීන් ඒකාබද්ධ කිරීම සහ අන්තර් සංස්කෘතික පෝෂණය කෙරෙහිය.

මාධ්‍ය සංස්කෘතියේ අතරමැදි අන්තර් කාර්ය මගින් සමාජයේ විවිධ ව්‍යුහ අතර, අංග අතර සම්බන්ධතා ගොඩනැගීම සඳහා භාවිත කරනු ලැබේ. එහිදී විවිධ සමාජ කණ්ඩායම්වලට එකිනෙක සමඟ අදහස්, හැඟීම්, ආකල්ප, දැනුම ආදිය හුවමාරු කරගැනීමට අවශ්‍ය ඉඩ කඩ සම්පාදනය කර දෙන්නේය. මෙහිදී මාධ්‍ය සංස්කෘතිය පාලනයේ, කළමනාකරණයේ උපකරණයක් ලෙස ක්‍රියා කරන්නේය. පාලකයින් සහ පාලිතයන් අතර ද පාලකයින් සහ ජනතාව අතර ද ඇති වන ප්‍රශ්න ගැටලු සහ ගැටුම්කාරී තත්ත්වයන් නිරාකරණය කර ගැනීම සඳහා දෙපාර්ශවයටම එක සේ අවශ්‍ය වන උපකරණයකි. මාධ්‍ය සහ මාධ්‍ය සංස්කෘතියේ අන්තර් කාර්ය, මාධ්‍ය සිව්වැනි බලය යන සංකල්පය ද බිහි වූයේ මාධ්‍ය සංස්කෘතියේ අන්තර් කාර්ය පාදක කොට ගෙන බව සඳහන් කළ යුතුය.

වර්තමාන ශ්‍රී ලංකා සමාජයේ වර්ධනය සඳහා උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනගා ගැනීම අත්‍යවශ්‍ය කොන්දේසියකි. පුද්ගලයාගේ, සමාජයේ, ජනතාවගේ සංස්කෘතික, බුද්ධිමය, සදාචාරාත්මක, කලාත්මක මට්ටම පමණක් නොව, සමකාලීන ලෝක සංස්කෘතියේ මූලික හර පද්ධති වන මානවවාදය, ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස, සමානාත්මතාවය යන වටිනාකම් ශක්තිමත් කිරීම සඳහා යෝග්‍ය මාධ්‍ය සංස්කෘතියක් නිර්මාණය කිරීම කාලීන අවශ්‍යතාවකි.

## ආශ්‍රිත ග්‍රන්ථ


- Zenoviev A (1995) West - Phenomenon of Westernism Centropoligraf, Moscow.
- Silicher D. A. (2000) Culturology, prior publication, Moscow.
- වීරසිංහ, වියුඩර් (2015) පශ්චාත් සංග්‍රාමික ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ මාධ්‍ය සංස්කෘතිය, සමාජ සහ සංහතික පාලනයේ නව උපකරණයක් ලෙස, ජනමාධ්‍යවේදය ජනමාධ්‍ය අධ්‍යයනය සහ විචාර, මාධ්‍ය සංස්කෘතිය, වෙළුම 5, ප්‍රධාන සංස්කාරක, ධර්මකීර්ති ශ්‍රී රන්ජන්, ප්‍රකාශනය, මාධ්‍ය පර්යේෂණ අංශය, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය.
- Benjamin W. The work of Art in the Age of mechnical Reproduction// Illuminations. New York : Shocken 1968 (1936)
- Mcluhan M. (1964) Understanding media: The extensions of men, New York: McGraw-Hill.
- Mcluhan M (1960) "The medium is the message." Forum (Houston, Summer
- Mcluhan M. (1962), The Gutenlerg Galaxy: The making of Typographic man, Toronto University of Toronto Press.
- Jameson. F. (1991) postmodernism: or, cultural Logic of Late Capitalism, London and New York Verso.
- Baudrillard J. (1994) Simulacra and Simulation, University of Michigan press.
- Zizek. S. (1998) Cyberspace, or exeruciating Reticence of existence
- Bourdieu, P. (1986) The struggle for Symbolic order// Theory, culture and society, vol.3.
- වීරසිංහ, වියුඩර් (2014) මාක්ස්වාදී සහ නව මාක්ස්වාදී සංහතික මාධ්‍ය න්‍යාය, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.
- White leslie (1959), The Evolution of culture; The development of civilization of the fall of Rome, New York Mcgraw - hill